කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය (පුනර්) 1වසර, ~~2020~~ 2019

අපරාධ නීතිය

(පැය තුනයි)

මුළු ප්‍රශ්න ගණන: 07

ඕනෑම ප්‍රශ්න <u>හතරකට</u> පිළිතුරු සපයන්න .

(අපහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

1. '*actus non facit reum nisi mens sit rea*' නම් ආප්තය මගින් දැක්වෙන්නේ, සාපරාධී වරදකට පුද්ගලයෙකු වරදකරු කළ හැකි වන්නේ ඔහු/ඇය සාවද්‍ය මනසක් සහිතව දණ්ඩන ව්‍යවස්ථාවක් මගින් තහනම් කරනු ලැබූ ක්‍රියාවක් සිදුකරන විට පමණක් බවයි. කෙසේවුවද, සමාජයේ උපරිම යහපත සැලකිල්ලට ගනිමින්, වර්තමාන අපරාධ නීති තන්ත්‍රය මෙම ආප්තයට විවිධ ව්‍යතිරේඛයන් හඳුනා ගනී.'

   සාකච්ඡා කරන්න. අදාළ ව්‍යවස්ථාපිත හා නඩු නීති අධිකාරීන් සමඟ ඔබේ පිළිතුර ඉදිරිපත් කරන්න.

2. (අ) ගාමිණී සහ සුනිල් අතර තිබූ සබඳතාවය කලක සිට බිඳවැටීඇත. සුදුසු මොහොතේදී සුනිල්ට හොඳ පාඩමක් උගන්වන බව ගමිණී සිය මිතුරා වන බන්ඩාරට පවසා තිබේ. එක් ඉරිදා දිනක සවස සුනිල් සිය බිරිඳ සමඟ සුපිරි වෙළඳසැලක සිට තමාගේ මෝටර් රථයෙන් නිවසට පැමිණෙමින් සිටි අතර සුනිල්ගේ නිවස අසල පාරේ වංගුව ළඟ ගාමිණී රැක සිටියේය. වාහනයේ වේගය අඩු වනවාත් සමගම ගාමිණී, සුනිල්ට වෙඩි තැබූ නමුත් ඉලක්කය මග හැරී එය මෝටර් රථයේ ටයරයට වැදීමෙන් ටයරය පුපුරා ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවූ අනතුර හේතුවෙන් සුනිල්ගේ බිරිඳ එම ස්ථානයේදීම මිය ගියාය.

   ගාමිණීගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න.

(ආ) දනියෙල්, ඔහුගේ මිතුරන් දෙදෙනා ගේ සහය ඇතිව ව්‍යාජ තුවක්කුවක් භාවිතා කරමින් රාත්‍රියේ ඉන්ධන පිරවුම්හලක් කොල්ලකෑමට උත්සාහ කලේය. තුවක්කුකරු, මුදල් කවුළුව වෙත ළඟාවනු දැකීමෙන් වෙඩි නොවදින වීදුරුව පිටුපස ආරක්ෂා සහිතව සිටි සෞඛ්‍ය සම්පන්න තරුණ පුද්ගලයෙකු වූ අයකැමි හෘදයාබාධයකින් මිය යයි.

ඉහත අවස්ථාවට සම්බන්ධ නීතිමය ගැටළු සාකච්ඡා කරන්න.

3. (අ) රුවන්, පාසලක බාලිකා නේවාසිකාගාරයට එහි පිටුපස මිදුල හරහා හොර රහසේ ඇතුළුවනවා හසුවිය. මුර සංචාරයේ යෙදී සිටි පොලිස් නිලධාරියෙකු ඔහුගේ මෝටර් බයිසිකලයේ ඉදිරිපස ප්‍රධාන ලාම්පුව (head- light) ඔහු දෙසට හරවන විට රුවන් දුවන්නට පටන් ගත්තේය. ඔහුව අල්ලා ගැනීමට පොලිසිය අපොහොසත් වුවද, පිටුපස මිදුලේ අඳුරු ප්‍රදේශය අසල ඔහු විසින් විසිකර දමා ගොස් තිබූ ඔලොගුවක් පොලිසිය විසින් සොයා ගන්නා ලදී. විශාල මුළුතැන්ගෙයි පිහියක්, දිග කඹයක් සහ ආවරණ පටි රෝලක් එම මල්ලෙහි තිබුණි. අසළ මාර්ගයේ සවි කර තිබූ සීසීටීවී කැමරාව ආධාරයෙන් හඳුනාගත් රුවන්ව එම සිද්ධියෙන් දින තුනකට පසු අත්අඩංගුවට ගනු ලැබීය.

රුවන් කිසියම් වරදක් කර තිබේද? එසේ නම්, ඔහුට එරෙහිව නඩු පැවරිය හැකි වරදෙහි ස්වභාවය කුමක්ද? අධිකාරීන් උපුටා දක්වන්න.

(ආ) අගනුවර සංචාරක හෝටලයක් තුල බෝම්බයක් ඇටවීමට අදහස් කරන කේෂවන් සිය ගමන් මල්ල රැගෙන හෝටලයට ගියේය. හෝටලයේ දොරටුවේ ඉදිරිපසට ආසන්නයේ පිහිටි නානකාමරයක් තුළදී බෝම්බයේ ප්‍රේරකයට වයර් සම්බන්ධ කිරීමට පටන් ගත් ඔහු හෝටලයෙන් පිටවීමට සූදානම්ව සිටියේය. ඔහු එම නාන කාමරයෙන් පිටතට පැමිණෙන විට ඔහුගේ ප්‍රියතම නිළියවන සොනාලි කුඩා දරුවන් පිරිසක් සමඟ හෝටලයට ඇතුළු වන අයුරු ඔහු දුටුවේය. රටෙහි සිටින, අතහැර දමා ගොස් ඇති සහ අනාථ දරුවන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ රූගත කිරීමේ වැඩසටහනකට ඔවුන් සම්බන්ධ විය.

ඔවුන් දැකීමෙන්, නිළිය කෙරෙහි ඇති ඇල්ම සහ දරුවන්ට ඇති ආදරය නිසා ඔහුගේ අදහස වෙනස් කරගනිමින්, කේෂවන් නැවත ඉක්මනින්ම එම නාන කාමරයට ගොස් බෝම්බය නිෂ්ක්‍රීය කිරීමට පටන් ගත්තේය. ඔහු බෑගය ආපසු නොගෙනම එතැනින් නික්ම ගියේය. කෙසේ වෙතත්, දින දෙකකට පසු, රටේ ත්‍රස්ත විරෝධී ඒකකය විසින් ඔහු අත්අඩංගුවට ගෙන ත්‍රස්තවාදී වැරදි කිහිපයක් සම්බන්ධව ඔහුට එරෙහිව නඩු පවරන ලදී.

කේෂවන්ගේ නීතිඥවරයා තර්ක කරන්නේ කේෂවන් කිසිදු වරදක් කර නොමැති බවත්, ඔහු අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම මූළුමනින්ම නීති විරෝධී සහ අයුක්ති සහගත බවත්ය.

කේෂවන් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ කිසියම් වරදක් කර තිබේද? සාකච්ඡා කරන්න.

4. අද, රටේ නෛතික තන්ත්‍රය තුළ පුද්ගල නිදහස සඳහා ලබා දී ඇති ප්‍රමුඛ ස්ථානය සැලකිල්ලට ගනිමින්, එම වරද සිදුකිරීමේදී ඔවුන්ගේ සැබෑ භූමිකාව පිළිබඳව කිසිදු තැකීමක් නොකර එකම වරද සිදුකිරීමට සහභාගී වූ සියලු දෙනාටම පොදු චේතනාව ආරෝපණය කිරීමට තර්ක කිරීම අසාධාරණ වන එබැවින් එය නිවැරදි කළ යුතුය.

ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

5. (අ) තම හිටපු පෙම්වතිය වූ රමනීගේ මුහුණ සදහටම විකෘති කිරීමට අදහස් කරන කමල් උණු වතුර භාජනයක් ඇගේ මුහුණට විසි කරයි. කෙසේවෙතත්, ඇය හදිසියේම ඇගේ මුහුණ වම්පසට හරවන විට, විසිකල ජලය හේතුවෙන් ඇගේ දකුණුපස ඇස පිළිස්සී යයි.

කමල් කළ වරද කුමක්ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) අයුතු අවහිරය සහ අයුතු සිරකරතැබීම අතර ඇති අසමානතා සඳහන් කර නඩු නීති අධිකාරිය උපුටා දක්වමින් එම වරදවල් දෙක එකිනෙක හා සංසන්දනය කරන්න.

6. මාලා සහ රමේෂ් කොළඹ විශ්ව විද්‍යාලයේ දී මිතුරු විය. ඔහුගේ පැරණි මිතුරන්ට මාලා හඳුන්වාදීම සඳහා සෙමෙස්තර නිවාඩුවේදී මාලාට තම උපන් නගරයට පැමිණෙන ලෙස රමේෂ් ආරාධනා කළේය. අධ්‍යයන චාරිකාවකට යාමේ මුවාවෙන් ඇගේ දෙමව්පියන්ගෙන් අවසර ලබා ගනිමින් මාලා ගමනට පිටත් වූවාය. ඇය සවස් වරුවේ ළඟම ඇති කුඩා නගරයට පැමිණි අතර රමේෂ් ඇයව බස් නැවතුම්පොළට ගොස් පිළිගත්තේය. ඔහුගේ ගමට ළඟා වීමට ඔවුන්ට තවත් කිලෝමීටර් දහයක් ගමන් කිරීමට සිදුවිය. කලුවර වැටී තිබුනු නිසා නගරයෙහි අසල පිහිටි නවාතැන්පොළක නැවතී පසුදින උදැසන ඔහුගේ ගමට යෑම සඳහා පිවත්විය හැකි බව ඔහු මාලාට ඒත්තුගැන්වීය. මාලා කැමැත්තෙන්ම ඊට එකඟ විය.

ඔවුන් එකම කාමරයේ නැවතී සිටි අතර ලැගුම්හල් සේවිකාවන් විසින් සපයන ලද ආහාර ඔවුහු එකිනෙකා අතර බෙදා ගත්හ. ආහාර ගැනීමෙන් පසු මාලාට කරකැවිල්ලක් දැනුණු අතර ඇය

රමේෂ්ට පැවසුවේ දිගු ගමන නිසා තමා දැඩි වෙහෙසට පත්ව සිටින බවත් ඉක්මනින්ම නින්දට යාමට අවශ්‍ය බවත්ය. කෙසේ වෙතත්, රමේෂ්ට අවශ්‍ය වූයේ ඇය අවදියෙන් සිටීමයි. රමේෂ්ගේ ඉල්ලීම නොතකා ඇය තම ඇඳ ඇතිරිල්ල රමේෂ්ගේ අතින් උදුරාගෙන ඇඳට ගියාය. උදෑසන ඇය අවදිවන විට ඇයට දැඩි ශරීර වේදනාවක් දැනුණු අතර ඇගේ කකුල් වල ලේ පැල්ලම් දක්නට ලැබුණි. එසේම, නිවසින් ගෙනා ඇඳ ඇතිරිල්ලද සොයා ගැනීමට මාලාට නොහැකි විය.

ඇය විසින් ඔහුගෙන් ප්‍රශ්න කිරීමේදී තමා නිර්දෝෂී බව රමේෂ් පවසා සිටියි. පෙර දින රාත්‍රී භෝජනය ගනිමින් සිටියදී ඇයව මත්කරවන්නට ඇති බවට ඇය සැක කරයි. ඇය ආපසු නිවසට පැමිණ ඇගේ දෙමාපියන්ට පැමිණිලි කළ විට ඔවුහු ඇය හා එක්ව ඒදුගැන පොලිසියට පැමිණිලි කළහ.

එම අවාසනාවන්ත දිනයේදී තමා මාලා සමඟ ලිංගික සංසර්ගයක් පැවැත්වූ නමුත් එය ඇයගේ පූර්ණ කැමැත්ත ඇතිව සිදුවූ බව රමේෂ් පොලිසියේදී විමර්ෂණ අතරතුර පිළිගෙන ඇත.

ඉහත අවස්ථාවට අදාල නීතිමය ගැටළු මොනවාද? මාලා පාසල් දැරියක් නම් සහ රමේෂ් ඇගේ මුහුණුපොතේ මිතුරෙකු නම් ඔබේ පිළිතුර වෙනස් වේද?

7. වූදිත පුද්ගලයාගේ දුර්වල මානසික තත්ත්වය (සිහිවිකලත්වය) නම් ව්‍යතිරේඛය පුද්ගලයෙකුගේ මානසික ආබාධ/කැළඹිලි තත්ත්වයන් පුළුල් පරාසයක් තුල ආවරණය කිරීමට තරම් ඉංග්‍රීසි නීතිය ප්‍රවර්ධනය වී තිබුනද, ශ්‍රී ලංකාවේ මෙම විත්තිවාචකය වූදිත පුද්ගලයන් විශාල පිරිසකට එය යාවනය කිරීම අහිමි කරන ඉපැරණි මැක්නෝටන් රීතීන් ගේ හුදු පිළිබිඹුවක් පමණි.

ඉහත ප්‍රකාශය එංගලන්තයේ සහ ශ්‍රී ලංකාවේ අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානවල සහාය ඇතිව සාකච්ඡා කරන්න. විනිශ්චිත නඩු තීරණ සමඟ ඔබගේ පිළිතුර ඉදිරිපත් කරන්න.

*************